GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012/10/16

## මාධ්‍ය නිවේදනයයි

මධ්‍යම පලාත තුල සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යෑමේදි මේ වන විට දැඩි අර්බුදකාරී තත්වයක් උද්ගතවී ඇත. මෙයට මූලික හේතුව වී ඇත්තේ මධ්‍යම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා වෛද්‍ය ශාන්ති සමරසිංහ මහත්මියගේ ක්‍රියා කලාපය හා සමහර දේශපාලඥයන්ගේ නොමනා ක්‍රියාකාරිත්වයයි. මේ වන විට මධ්‍යම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරිය සහභාගි වන කිසිදු රැස්වීමකට සහභාගි නොවීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කිරීමෙන් අනතුරුව තිරණය කර ඇත. මෙම කරුන නිසා එතුමිය විසින් සිය දේශපාලන හිතවත්කම් උපයෝගි කරගෙන මධ්‍යම පලාත තුල සේවයේ නියුතු වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පීඩාවට පත් කිරීම ආරම්භ කර ඇත. එහි ආසන්නතම සිද්ධිය ලෙස තම රාජකාරිය සඳහා නිල රථයෙන් යමින් සිටි මහනුවර සැලසුම් වෛද්‍ය නිලධාරියාට මහමගදී පරුෂ වචනයෙන් බැන වැදි රියදුරුට ද තර්නය කර සිය ධූරයට කිසිසේත්ම නොගැලපෙන අයුරින් හැසිරීම දැකිවිය හැකිය.

එමෙන්ම පසුගිය දිනක සිය රාජකාරී කටයුත්තක් සඳහා කොළඹ දි පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාද සහභාගි වු රැස්වීමකට මහනුවර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ඩබ්. විජේසිංහ මහතා සහභාගි වෙමින් සිටියදී මධ්‍යම පලාත් ආණ්ඩුකාරවරයා මහනුවර ප්‍රාදේශිය අධ්‍යක්ෂක කාර්යාලයට පැමිණ එතුමා සිය කාර්යාලයේ නොමැති බවට චෝදනා කර මාධ්‍ය සංදර්ශනයක් පැවැත්වීමද ඉහත කී පලාත් අධ්‍යක්ෂතුමියගේ සැලසුමක් බවට අනාවරණය වී ඇත.

මෙම ක්‍රියාකලාපය නිසා මධ්‍යම පලාත් වෛද්‍යවරුන් සිය නොසන්සුන්තාවය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට දැනුම්දී ඇත. තත්වය දිගින් දිගටම මෙසේ පැවතියහොත් මේ සම්බන්ධයෙන් දැඩි වෘත්තිය තිරණ ගැනීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තීරණය කොට ඇති අතර එම ක්‍රියාමාර්ග තුලින් මධ්‍යම පලාතේ සෞඛ්‍ය සේවයේ වන බිඳවැටීම් වල පූර්ණ වගකීම මධ්‍යම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරිය හා ඇයට රැකවරනය ලබා දෙන දේශපාලඥයින් විසින් සම්පූර්ණයෙන් භාරගත යුතු බව අපි අවධාරණය කරමු.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩිදුර විස්තර :-

| | |
|---|---|
| වෛද්‍ය නාත් විජේසූරිය | : 0714428322 |
| වෛද්‍ය නලින්ද හේරත් | : 0717876516 |
| වෛද්‍ය නවීන් සොයිසා | : 0718582444 |